**සංශෝධනයයි**

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

අංක 2,426 හා 2025 පෙබරවාරි මස 28 වන සිකුරාදා දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර තිබූ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 යන නිවේදනයේ මාතෘකාව, 1 හා 07. i ඡේද පහත පරිදි සංශෝධනය කරමි.

2025 පෙබරවාරි මස 28 දිනැති ව පළ වූ කැඳවීම් නිවේදනයේ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය හැර අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව කරුණාවෙන් සලකන්න. මේ වන විට අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමට අවශ්‍ය නොවන බව ද තවදුරටත් දන්වා සිටිමි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය එන්ජින් රියදුරු තනතුරේ පුරප්පාඩු 162ක සංඛ්‍යාව පිරවීම සඳහා 2025.03.28 දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකීක පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2025 වර්ෂයේ ජූලි මාසයේදී කොළඹ දී පැවැත්වීමට නියමිතව ඇත.

07. i. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ " Online Applications – Recruitment Exams / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් බාර ගැනීම **2025 අප්‍රේල් මස 11** වැනි දින **පෙ.ව. 9.00**ට විවෘත වන අතර **2025 මැයි මස 09** වැනි දින **රාත්‍රී 9.00** ට අවසන් වේ.

ජේ.අයි.ඩී.ජයසුන්දර,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2025 අප්‍රේල් මස 07 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
අංක 355, ඕල්කට් මාවත,
කොළඹ 10.

04-127